# උපාධි නිබන්ධන සකස් කිරීමේ ප්‍රමිතිගත විධි ක්‍රම

## Standards for Thesis Writing

K.G.D.A. Karunanayaka

වර්තමානයේ පර්යේෂණ කෘති ඉදිරිපත් කිරීමේදී පර්යේෂකයාට මුහුණ පෑමට සිදුවන ගැටලුවක් ලෙස ප්‍රමිතිගත පර්යේෂණයක් සකස් කිරීමේ ක්‍රමවේදය දැක්විය හැකිය. විවිධ ආයතන මඟින් සකස් කෙරුණු ප්‍රමිතීන් අනුගමනය කිරීම නිසාත් විවිධ ප්‍රමිතීන් මිශ්‍ර වීම නිසාත් ප්‍රමිතිගත පර්යේෂණයක් ඉදිරිපත් කිරීමේදී විවිධ ගැටලු පැන නඟී. එමනිසා ISO - 7144 යටතේ ඇති පර්යේෂණ කෘතියක් ඉදිරිපත් කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතිය මෙම ලිපිය මඟින් පැහැදිලි කෙරේ. එම ප්‍රමිතියෙහි අත්‍යවශ්‍යම කොටස් පමණක් මෙම ලිපිය සඳහා උපයෝගී කොටගෙන ඇති අතර වෙනත් ISO ප්‍රමිතීන් ද පාදක කොට ගෙන තිබේ.

ප්‍රධාන වශයෙන් පර්යේෂණ කෘතියක් කොටස් 3 කට බෙදා දැක්විය හැකි අතර එයට අමතරව වැදගත් වන සුවිශේෂී කරුණු කිහිපයක්ද දක්නට ලැබේ

## Research Paper - Published - Unpublished (ISO - 7144)

### 1. Front Matter

1. Title Page (ග්‍රන්ථනාම පිටුව)
2. Statement of the Responsibility (වගකීම)
3. Declaration (ප්‍රකාශනය)
4. Table of Contents (පටුන)
5. Acknowledgement (ස්තුතිය)
6. List of Illustrations (චිත්‍ර පිටු)
7. List of Tables (වගු පිටු)
8. Abbreviations (හැකිලුම්)
9. Summary or Abstract (සාරාංශය)

### 2. Text Body

1. Introduction (හැඳින්වීම)
2. Main Text (ප්‍රධාන අන්තර්ගතය)
   * Parts (කොටස්)
   * Chapters (පරිච්ඡේද)
   * Paragraphs (ඡේද)
3. Headings (මාතෘකා)
   * Sub Headings (අනු මාතෘකා)
4. Quotations (උද්ධෘත)
5. References (විමර්ශන)
   * Foot Notes (පාදක සටහන්)
   * End Notes (පරිච්ඡේද අවසානයේ දක්වන විමර්ශන)
   * Parenthesized References (වරහන්) විමර්ශන)

### 3. Reference Matters

Note area (සටහන්)
Bibliography (ග්‍රන්ථනාමාවලී)
Glossary (පාරිභාෂික ශබ්දමාලාව)
Index (අනුක්‍රමණිකා)
Appendixes (ඇමුණුම්)

## 1. Front Matter

**Half Title Page** අර්ධ ග්‍රන්ථ නාම පිටුව

බොහෝ විට අර්ධ ග්‍රන්ථනාම පිටුව පර්යේෂණ හා මුද්‍රිත ප්‍රකාශනවල දක්නට නොලැබේ. එහෙත් පිළිගත් සම්ප්‍රදාය වන්නේ සම්පූර්ණ ග්‍රන්ථ නාමය හෝ අර්ධ ග්‍රන්ථනාමය දක්වීමයි. එහිදී ග්‍රන්ථනාමය පමණක් එම පිටුවේ දක්වීම සිදු කෙරේ. එය ග්‍රන්ථයේ මුල් පිටුවේ ග්‍රන්ථනාම පිටුවට කලින් ඇති දකුණු පස (Recto) පිටුවේ දක්විය යුතුය

Title Page ග්‍රන්ථනාම පිටුව

ග්‍රන්ථනාම පිටුව සකස් කිරීම සඳහා ඒ ඒ ආයතන විසින් සකසාගත් ක්‍රම තිබුණද, ඒ සඳහා දක්විය හැකි ප්‍රමිතිගත ක්‍රමය වන්නේ (ISO - 1086) යොදා ගැනීමයි. ග්‍රන්ථනාම පිටුවේ සඳහන් කළයුතු කරුණු වන්නේ

1. ග්‍රන්ථනාමය
2. කතුවරයා සහ ඔහුගේ අධ්‍යාපනික සුදුසුකම්
3. පර්යේෂණය අයත් විෂයය, පීඨය සහ අධ්‍යයන පාඨමාලාව
4. ආයතනය සහ දිනය

ග්‍රන්ථනාමය

ග්‍රන්ථනාමය ක්‍රම කිහිපයකින් ඉදිරිපත් කළ හැකිය.

1. ප්‍රධාන ග්‍රන්ථනාමය-ශ්‍රී ලංකාවේ සාක්ෂ්‍ය නීතිය
2. අනුග්‍රන්ථ නාමය : මෙය ප්‍රධාන ග්‍රන්ථ නාමය තවදුරටත් විස්තර කරයි.
   එහිදී ග්‍රන්ථනාම දෙක දෙතිත සලකුණින් වෙන් කළ යුතුය.
   උදා : Lost in Music: culture, style and the musical event.
3. සමාන්තර ග්‍රන්ථනාමය
   මෙහිදී ග්‍රන්ථනාමයට සමාන ග්‍රන්ථ නාමයක් දීම සිදුවේ. එහිදී ලකුණින්

ග්‍රන්ථනාම දෙක වෙන්කළ හැකිය.
උදා: Ten Days that Shocked the World-ලොව හෙල්ලූ දස දවස

4. විකල්ප ග්‍රන්ථනාමය

විකල්ප ග්‍රන්ථනාමය බොහෝවිට වරහන් තුළ දක්වයි. එමගින් ග්‍රන්ථනාමය පිළිබඳව තවදුරටත් විස්තරයක් සිදු කරනු ලැබේ.
උදා : තොරණ හා එහි විකාශනය (තොරණේ වරුණ)

ග්‍රන්ථනාමය ග්‍රන්ථනාම පිටුවේ උඩ කෙළවර සිට අක්ෂර පේළි 8 කට පසුව සටහන් කළ යුතුය.

උදා.

} පිටුවේ උඩ කෙළවර (අඟලක ඉඩක්)

} අක්ෂර පේළි 8 ක්

උපාධි නිබන්ධයේ නම

පර්යේෂකයාගේ නම
(වගකීම)
ලි.ප. අංකය

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධය

කොළඹ විශ්වවිද්‍යාලය
2002

## Verso of the title page (copy right page)

ග්‍රන්ථනාම පිටුව (පසුපස වම්පැත්ත)

පර්යේෂණ නිබන්ධය මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස එළි දක්වන්නේ නම් හිමිකම් පැවරීමේ ප්‍රකාශනය මෙම පිටුවේ සඳහන් කළ යුතුය. පිටුවේ උඩ කෙළවරේ සිට අක්ෂර පේළි 15 කට පසුව කුඩා රවුමක © අක්ෂරය දක්වා හිමිකම් ඇවිරීම සඳහන්කොට වර්ෂය සහ හිමිකම හිමිකරුවාගේ නම සඳහන් කළ යුතුය. එයට අමතරව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ප්‍රකාශිත වසර, ප්‍රකාශිත වාර ගණන, ප්‍රකාශකයා, ප්‍රකාශිත ස්ථානය, දිනය සහ ජාත්‍යන්තර ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN- සඳහන් කළ යුතුය. (ISO - 2108)

## Declar ation ප්‍රකාශනය

මෙහිදී පර්යේෂකයා තම පර්යේෂණය සඳහා උපුටාගත් විමර්ශන විධිමත්ව උපුටාගත් බවත් පර්යේෂණ මාතෘකාව ඔහුගේ දැනුමේ හැටියට වෙනත් පර්යේෂකයෙකු විසින් උපාධි පාඨමාලාවක් සඳහා ඉදිරිපත් කොට නොමැති බවත් පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය.

## Table of Contents පටුන

පටුන යනු පර්යේෂණයට ඇති පිවිසුමයි. එය පරිච්ඡේද මාතෘකා හා අනුමාතෘකාවලින් යුක්තවිය හැකිය. එසේම ග්‍රන්ථනාමාවලී සහ ඇමුණුම් ඇතුළත් විය යුතුය. පටුනේ ඇති මාතෘකා පර්යේෂණයෙහි ඇති මාතෘකා හා පිටු අංක සමඟ නිවැරදි විය යුතුය.

උදා.

පිටුවේ උඩ කෙළවර (අඟලක ඉඩක්)

අක්ෂර පේළි 8 ක්

පටුන

| | |
|---|---|
| | පිටු |
| ස්තුතිය | v |
| චිත්‍ර පිටු | ix |
| වගු පිටු | x |
| හැකිළුම් | xi |
| සාරාංශය | xii |
| පරිච්ඡේදය | |
| i හැඳින්වීම | 1 |
| ii දෙවන පරිච්ඡේදයේ මාතෘකාව | 10 |
| iii තුන්වන පරිච්ඡේදයේ මාතෘකාව | 35 |
| iv හතරවන පරිච්ඡේදයේ මාතෘකාව | 40 |
| v | 50 |
| vi | 54 |
| සටහන් | 60 |
| ග්‍රන්ථ නාමාවලිය | 62 |
| ඇමුණුම් | 68 |

## Acknowledgement ස්තුතිය

මෙහිදී කතුවරයා සිය පර්යේෂණ කෘතියෙහිදි ඒ සඳහා උදව් උපකාර වූ උපදේශකයින් සහ සහායකයින් සිහිපත් කළ යුතුය. උදව් වූ පුද්ගලයින් සහ ආයතන සඳහන් කළ යුතුය. එය ඉතා සරලව අදාළ කරුණුවලින් පමණක් යුක්ත විය යුතුය. ස්තුතිය පටන්ගත යුත්තේ පිටුවේ උඩු කෙළවරින් අක්ෂර 12 ක ඉඩක් ගිය පසුවය.

## List of Illustrations එලක පිටු - චිත්‍ර

චිත්‍ර පිටු සඳහා නිවැරදිව යොමු අංක ලබා දිය යුතු අතර මාතෘකා එක සමාන විය යුතුය.

## List of Tables වගු

මෙය පටුනට පසුව අලුත් පිටුවකින් ඉදිරිපත් කළ යුතුය. එහි ඇති යෙදුම් පර්යේෂණයේ ඇති යෙදුම් සමඟ සමාන විය යුතුය. පිටු අංකනය ඉතා නිවැරදි විය යුතුය.

උදා.

පිටුවේ උඩ කෙළවර (අහලක ඉඩක්)

අක්ෂර පේළි 12 ක්

වගු ලැයිස්තුව

| වගු | | | පිටු |
|---|---|---|---|
| 1 | උපත් මරණ අනුපාතය | වගුව 1 | 9 |
| 2 | දිස්ත්‍රික් පෝෂණ මට්ටම | වගුව 2 | 10 |
| 3 | -------------------- | වගුව 3 | 20 |
| 4 | -------------------- | වගුව 4 | 25 |
| 5 | -------------------- | වගුව 5 | 29 |
| 6 | -------------------- | වගුව 6 | 35 |
| 7 | -------------------- | වගුව 7 | 40 |
| 8 | -------------------- | වගුව 8 | 44 |
| 9 | -------------------- | වගුව 9 | 48 |
| 10 | -------------------- | වගුව 10 | 55 |
| 11 | | | 58 |
| 12 | | | 60 |

## Abbreviations හැකිළුම්

හැකිළුම් වල ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණයෙහි නිතර භාවිත වැදගත් දිගු යෙදුම් ඉතා කෙටි පොදු හැකිළුමකින් දක්වීමය. එහිදී

හැකිළුම පර්යේෂණය පුරාම ඒකරූපී විය යුතුය. එය කෘතියෙහි ඉඩ කඩ ඉතිරි කර දෙනු ලැබේ. ප්‍රමිතිගත ක්‍රමයක් මෙහිදී අනුගමනය කළ යුතුය. හැකිළුම් අක්ෂරවලට පසු . (තිත) භාවිත කළ යුතුය. (ISO - 832)

## Abstract සාරාංශය

මෙය පර්යේෂකයා විසින් ඉතාම කෙටියෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනයකි. එය පර්යේෂණයෙහි අත්‍යවශ්‍යම මූලිකාංග පිළිබඳව කරනු ලබන දළ සැකැසුමකි. මෙය අත්‍යවශ්‍යම අංගයක් නොවුනද බොහෝ පර්යේෂකයන් සිය පර්යේෂණ සඳහා භාවිත කොට ගන්නා ක්‍රමයකි. මෙයද වෙනම පිටුවක් ලෙස දක්විය යුතුය. සමහරු මෙය ග්‍රන්ථනාම පිටුවට පසුව දක්වති.

සාමාන්‍ය සාරාංශයක් වචන 500 කට වඩා නොවැඩි විය යුතුය. මෙහි ප්‍රධාන වශයෙන් අධ්‍යයනයේ ගැටලුව, භාවිත විධි ක්‍රමය, නියැදිය, සහ නිගමන සඳහන් කළ යුතුය. සාරාංශය පර්යේෂණයෙහි අරමුණ හා ගැළපිය යුතු අතර පර්යේෂණයේ ප්‍රතිඵල මත පිහිටා සකස් කළ යුතුය. (ISO - 214)

## 2. Secondary Matters

### Main Text ප්‍රධාන අන්තර්ගතයන් (පෙළ)

### Introduction හැඳින්වීම

පර්යේෂණයක අන්තර්ගතයේ ප්‍රථම කොටස ලෙස මෙම හැඳින්වීම දක්විය හැකිය. හැඳින්වීම ඉතා කුඩා වූවක් නම් ප්‍රථම පරිච්ඡේදයේ කොටසක් ලෙසද දක්විය හැකිය. මාතෘකාව හැඳින්වීම (introduction) ලෙස දක්විය යුතුය. පර්යේෂණයේ ඉතිරි ප්‍රධාන කොටස් පරිච්ඡේද ලෙස දක්වීම පිළිගත් ක්‍රමය වේ.

හැඳින්වීමෙහි සාමාන්‍යයෙන් අඩංගු විය යුත්තේ අධ්‍යයන ගැටලුව, අරමුණු, උපකල්පන, අධ්‍යයනයෙහි පසුබිම එහි වැදගත්කම, සීමා, භාවිත යෙදුම් ආදියෙනි. බොහෝ විට නියදිය හා ක්‍රමවේදය ද

හැඳින්වීම යන කොටසෙහි දක්වන අවස්ථා ඇත. එම කොටස් වෙනම දක් වූ අවස්ථා ද වේ. එය තීරණය කළ යුතු වන්නේ ඒ සඳහා යොදා ගන්නා ඉඩකඩ ප්‍රමාණය මතය. පරිච්ඡේදයක් ලෙස දක්වීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඉහත දක් වූ අංග හැඳින්වීම යටතේ පෙළගැස්වීම වඩා සුදුසුය.

**Text** අන්තර්ගතය


පර්යේෂණයෙහි අන්තර්ගතය. (The body of the text) පරිච්ඡේද මඟින් ඉදිරිපත් කෙරේ. සෑම පරිච්ඡේදයක්ම අලුත් පිටුවක් (දකුණු පසින් Recto Page) විය යුතුය.

පර්යේෂණයෙහි ඉතාම වැදගත් කොටස අන්තර්ගතයයි. මෙය ඉදිරිපත් කිරීමේදී පර්යේෂකයා ඉතාමත් සැලකිල්ලෙන් එම කොටස් බෙදාගත යුතුය. පරිච්ඡේද ගණන පර්යේෂණයෙහි පරාසය මත තීරණය වේ. එහෙත් බොහෝ විට පරිච්ඡේද 5–8 අතර තිබීම වැදගත් වේ. පරිච්ඡේදයේ අඩුවැඩි කිරීමේ අයිතිය පර්යේෂකයාට පැවරේ. ප්‍රධාන අන්තර්ගතය ඉදිරිපත් කිරීමේදී පර්යේෂකයා සිය අවධානය යොමුකළ යුතු ප්‍රධාන කරුණු වන්නේ

පරිච්ඡේද අංක කිරීම
පරිච්ඡේද බෙදීම
පරිච්ඡේද මාතෘකා සැපයීම
ප්‍රධාන හා අනුමාතෘකා යෙදීම යනාදියයි.

පරිච්ඡේදයක් අංකනය කරන්නේ නම් එය රෝම ඉලක්කම් හෝ අරාබි ඉලක්කම්වලින් අංකනය කළ යුතුය. පරිච්ඡේදයක් මාතෘකාවකින් හඳුන්වන්නේ නම් සියලුම පරිච්ඡේදවලට මාතෘකා දිය යුතුය. පළමු පරිච්ඡේදය හැඳින්වීම යටතේ මාතෘකා කළ හැකිය. සාමාන්‍යයෙන් උපාධි නිබන්ධනවල පරිච්ඡේද මාතෘකා කිරීම පාඨක අවශ්‍යතා වෙනුවෙන් සිදු කරනු ලැබේ. පරිච්ඡේදයක් මාතෘකා නොකොට ඉදිරිපත් කරන්නේ නම් පටුන මඟින් පිවිසුමක් පරිච්ඡේදයට ලබාදීම දුෂ්කර වේ. පරිච්ඡේදවල ඇති මාතෘකාම පටුනෙන්ද ඒ අයුරින්ම දක්විය යුතුය. එහෙත් මාතෘකා ඉතා දිගු නම් පටුනෙහි මාතෘකා යෙදීමේදී අදහස මැනවින් දක්වෙන පරිදි මාතෘකාව කෙටි කොට දක්විය හැකිය.

පරිච්ඡේද මාතෘකාව උඩුකෙළවරේ සිට අක්ෂර පේළි 12 ක ඉඩක් තබා සඳහන් කළ යුතුය.





පරිච්ඡේද මාතෘකාවලට අමතරව බොහෝ පර්යේෂකයන් පර්යේෂණය සඳහා අනුමාතෘකා භාවිත කිරීමට ප්‍රිය කරති. එවැනි අවස්ථාවකදී අනුමාතෘකා අංකනය කිරීම අතවශ්‍යම නොවේ. එහෙත් මුළු පර්යේෂණය පුරාම එක ක්‍රමයක් භාවිත කළ යුතු අතර අනුමාතෘකාවල අක්ෂරවල ප්‍රමාණය (font size) ප්‍රධාන මාතෘකාවට වඩා කුඩා විය යුතු අතර ප්‍රධාන මාතෘකාවලට වඩා අක්ෂර පේළි දෙකක් පහළින් සඳහන් කළ යුතුය.

අනුමාතෘකා යෙදීමේදී

1. පිටුව මැද (The Center Heading) බොහෝවිට පරිච්ඡේද මාතෘකා සඳහා සුදුසුය.
2. වම්පස තීරුවේ (The Left Margin Heading)
3. මාතෘකාව සමඟම අන්තර්ගතය යෙදිම (The Run on Heading) යෙදිය හැකිය.

උදා.



## Quotations උද්ධෘත

ඉතා සාර්ථක පර්යේෂණයක සුලබව දක්නට ලැබෙන දෙයකි. උද්ධෘත තෝරාගත යුතු වන්නේ ඒවා ඉතාමත් වැදගත් වන්නේ නම් පමණි. උද්ධෘතයක් බොහෝ විට වචනයක්, (Word– වාක්‍යයක්, (Sentences) වාක්‍ය ඛණ්ඩයක් (Phrase) හෝ ඡේදයක් (Paragraph) විය හැක. උද්ධෘතය හැකිතාක් දුරට සංක්ෂිප්ත වීම දක්ෂ පර්යේෂකයෙකුගේ ලක්ෂණයකි. උද්ධෘතය – එය උපුටාගත් කෘතියෙහි දක්වෙන අක්ෂර, විරාම ලක්ෂණ ආදිය කිසිවක් නොඅඩුව දක්විය යුතුය. උද්ධෘතය පර්යේෂකයාට වෙනස් කළ නොහැකිය. මූලික කෘතියෙහි ඇති සියලුම කරුණු ඒ අයුරින්ම උපුටාගත යුතුය.

උද්ධෘත ලබා ගැනීමේදී නෛතිකම ගැටලු පැන නඟී. සාමාන්‍යයෙන් හිමිකරුගේ අවසරය ලබාගැනීම අවශ්‍ය වුවත් උද්ධෘතයක් ඉදිරිපත් කිරීම මූලික ප්‍රමිති මත ඉදිරිපත් කළ හැකි නම් ඒ සඳහා නීතිමය බාධාවක් පැන නොනඟී. උද්ධෘතය ඒ අයුරින්ම දක්වීම මෙහිලා වැදගත් වන්නේ එබැවිනි. උද්ධෘතයෙහි ඇති කරුණු තමන්ගේ වචනවලින් දක්වන්නේ නම් ඒ සඳහා නිසි විමර්ශනයක් දිය යුතුය. උද්ධෘතය ඉදිරිපත් කළ යුතු ක්‍රම කිහිපයකි.

උපුටා ගැනීම ගද්‍යමය කොටසක් නම්, එය වාක්‍ය හතරකට නොවැඩි නම් එය තම පර්යේෂණයෙහි වාක්‍ය අතරම උද්ධෘත හඟවන විරාම ලක්ෂණය ‘ ’ තුළ දක්විය යුතුය.

උදා.

‘පිළිගැනීමට කලින් රාජ්‍යයක හෝ ආණ්ඩුවක දේශපාලන පැවැත්මක් ඇත.’02 යනුවෙන් 1948 දී බොගෝටා නුවරදී ඇමරිකා රාජ්‍යය අත්සන් තබන ලදි.

උද්ධෘතය වාක්‍ය හතරකට වඩා වැඩි වන්නේ නම් එය පර්යේෂණයෙහි අන්තර්ගතයෙන් ඉවත් කොට වෙනම ඡේදයකින් පටන් ගත යුතුය. එය වම් පසින් ප්‍රධාන ඡේදයට අක්ෂර පේළි 10 ක (අහලක) වෙනම තීරයක් ලෙස ආරම්භ කළ යුතුය.

උද්ධෘතය තනි අක්ෂර පේළියකින් (Single space) යුක්ත විය යුතු අතර එහිදී උද්ධෘත ලක්ෂණ යෙදීම අනවශ්‍ය වේ. එහෙත් විමර්ශනයක් ලබා දීම අනිවාර්ය වේ.
උදා.
1935 අයර්ලන්ත ජනරජය නිදහස ප්‍රකාශ කළ අවස්ථාවේදී එහි අගමැති කියා සිටියේ මෙයයි.

> පැරණි රාජ්‍යයක කොටසක්ව පැවති පසුව නිදහස ලබා නවරාජ්‍යයක් හැටියට බිහි වීමෙන් පසුව පැරණි රජය විසින් ගිවිස ගත් සංධානයන්ට අනුප්‍රාප්ති ලැබීමට නම් අළුත් රජයේ කැමැත්ත ප්‍රකාශිතව හො අළුත් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන කල්ක්‍රියා තුළ ව්‍යංග ප්‍රකාශයක් වත් ඇති විය යුතුය.10

වාක්‍යයක වචනයක් හෝ කොටසක් පමණක් උපුටා දක්වා ඉතිරිය සඳහන් නොකරන අවස්ථාවකදී – උද්ධෘත ලකුණු තුළ තෝරාගත් වචන හෝ වාක්‍ය දක්වා ඉතිරි කොටස වෙනුවට තිත් තුනක් දක්විය යුතුය.
උදා : මැක් හියුබර් ඕලන්දයට පක්ෂව දුන් ප්‍රධානයේදී මෙසේ ප්‍රකාශ කර ඇත. 'දේශසීමා ආධිපත්‍යය ප්‍රකාශ වන ආකාරයන් විවිධය...' වශයෙනි.

## Bibliographic Reference

පර්යේෂණයක ග්‍රන්ථ විමර්ශන දක්වීම ඉතාමත් වැදගත් අංගයක් ලෙස සැලකේ. විමර්ශන යොමු මගින් සිදු කරනුයේ ඉතා නිවැරදිව තමන් පර්යේෂණයේදී භාවිත කළ උද්ධෘත හා වැදගත් තොරතුරු උපුටා ගත් මූලාශ්‍ර නිවැරදිව දක්වීමත්, ඒවායේ නිවැරදිතාවය තවදුරටත් විස්තර සහිතව දක්විමත්ය. මෙලෙස දක්වෙන විමර්ශන ක්‍රම තුනකට දක්විය හැකිය. මෙම විමර්ශන ක්‍රම ඉදිරිපත් කිරීමේදී ප්‍රධාන අන්තර්ගතයේ එය භාවිත කළ ආකාරය අනුවම දක්විය යුතුය


1. Foot Note (පාදක සටහන්)
2. End Reference (පරිච්ඡේදය අවසානයේ හෝ සම්පූර්ණ අන්තර්ගතය අවසානයේ දක්වන විමර්ශන)

## 3. Parenthesised Reference (වරහන් විමර්ශන)

### Foot Note පාදක සටහන්

මෙම විමර්ශන අරාබි ඉලක්කම් ක්‍රමයට එම පිටුවේම යට කොටසෙහි දක්විය යුතුය. පාදක සටහනේ අවසාන වාක්‍යය පිටුවේ යට කෙළවරින් අඟලකට උඩින් අවසන් කළ යුතුය. ප්‍රධාන ඡේදය පාදක සටහන වෙන්කිරීම සම්පූර්ණ ඉරකින් හෝ අක්ෂර 15 ක ඉරකින් සිදු කළ යුතුය.

සෑම පිටුවකම එම පිටුවට පමණක් සීමා වන සේ අංකනය කළ යුතුය. එහිදී සෑම පිටුවකම පාදක සටහන් ආරම්භ වන්නේ අංක 1 යටතේය.
උදා.



එසේ නොමැතිනම් පරිච්ඡේදය පුරාම අංකනය හඳුන්වා එම පිටුවේ ඇති අංකවලට අදාළ විමර්ශන එකී පිටුවේම යට දක්විය යුතුය.

**End Reference** පරිච්ඡේදය අග දක්වන විමර්ශන ක්‍රමය සෑම පරිච්ඡේදයක් අවසානයේදී අරාබි ඉලක්කම් සහිතව ඉහත කී පරිදි දක්විය හැකි ක්‍රමයකි. එහිදී එම පරිච්ඡේදයට අදාළ විමර්ශන, පරිච්ඡේදය අවසන අංක පිළිවෙළට දක්වේ. බහුලව භාවිත කරන ක්‍රමයක් ලෙස මෙය දක්විය හැකිය.

**The Parenthesized Reference** වරහන් විමර්ශන ක්‍රමය වර්තමානයේ විමර්ශන දක්වන ජනප්‍රිය ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය. විමර්ශනය අන්තර්ගතය තුලම එයට අදාළ තැන වරහන් තුල දක්වීම මෙම ක්‍රමයයි. වරහන් තුල කතුවරයාගේ වාසගම, ප්‍රකාශනයේ දිනය හා පිටු අංකය පමණක් දක්වෙයි. කතුවරුන් දෙදෙනෙක් නම් දෙදෙනාගේ වාසගම සඳහන් කළ යුතුය. අනෙකුත් තොරතුරුද කර්තෘ අනුව අකාරාදි ගොනුගත කළ විමර්ශන ලැයිස්තුවේ දක්විය හැකිය. මෙනිසා එය ඉතාමත් සාර්ථක ක්‍රමයක් ලෙස දක්විය හැක.

උදා : සාංචි තොරණේ විවිධ කැටයම් තුළ සෙල්ලිපි පාඨ 16ක් දක්නට ලැබේ. එමෙන්ම චීන මහා ප්‍රාකාරයේ ඇතැම් තොරණ තුළ මහායාන ධරණී සූත්‍රය ලියා තැබූ බව පෙනේ. (Zhewen and hao ed. 1986, p.12)

විමර්ශන ලැයිස්තුවේදී ප්‍රථම වතාවට තොරතුරු දක්වන්නේ නම් සංලේඛය (entry) සියලු විමර්ශන තොරතුරුවලින් යුක්ත විය යුතුය. පොතක නම් කර්තෘ, ග්‍රන්ථනාමය, පිටු අංකයද සඟරාවකනම් කර්තෘ, සඟරාවේ නම, ලිපියේ නම, වෙළුම, කලාපය, පිටු අංකය අනිවාර්ය වේ.

යම් ලෙසකින් එම කතුවරයාගේ එම කෘතියෙන්ම උපුටාගත් පාදක සටහනක් එක ළඟ දක්වන්නේ නම්, ඒ සඳහා පාදක සටහන් අංකය ඉදිරියෙන් Ibid යන්න හා පිටු අංකය යෙදිය යුතුය. ඉන්

කියවන්නේ එම විමර්ශනය ඉහත කෘතියෙන්ම උපුටාගත් බවයි. එසේ නොමැති නම් කතුවරයා වෙනුවට කුඩා ඉරක් (dash) යොදාගත යුතුය මෙම ක්‍රමය තරමක් පැරණි ක්‍රමයකි. එහෙත් එය භාවිත කිරීමේ වරදක් නොමැත.

උදා.

1. පීරිස්, ජී. එල්. ශ්‍රී ලංකාවේ සාක්ෂ්‍ය නීතිය.- කොළඹ : ගොඩගේ, 1998. පිටුව 70.

2. Ibid. p.80 (හෝ)

2. .p.80

යම් හෙයකින් එම කතුවරයාගේ කලින් භාවිතා කරන ලද කෘතියකින් නැවත උපුටාගත්තක් නම් එහිදී IDEM යෙදිය යුතුය.

## 3 Reference Matter (Supplementary Matters)

බොහෝ විට මෙම කොටසට අයත් වන්නේ

- සටහන් (Notes)
- ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය (Bibliography)
- පාරිභාෂික ශබ්ද මාලාව (Glossary)
- අනුක්‍රමණිකාව (Index)
- ඇමුණුම් (Appendix) වේ.

### Notes සටහන්

පර්යේෂණයේදී අදාළ කරුණු සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරක් ඉදිරිපත් කිරීමට සටහන් තීරුව උපයෝගී කොට ගත හැකිය. එම සටහන් පර්යේෂණයට අදාළ දෑ තවදුරටත් කරනු ලබන විස්තර කිරීමක් විය හැකිය. පර්යේෂණයෙහි අන්තර්ගතය අවසානයෙහිදී හෝ පිටුවෙහි යට පාදක සටහනක් ලෙස (foot-note) ලෙසද මෙය ඉදිරිපත් කළ හැකිය. සටහන බොහෝ විට සරල හා කෙටි විය යුතුය.

### Bibliography ග්‍රන්ථනාමාවලිය

ග්‍රන්ථනාමාවලියේදී භාවිත මූලාශ්‍රවල තොරතුරු මුල් මූලාශ්‍රයේ ග්‍රන්ථනාම පිටුවේ දක්වෙන පරිදිම වෙනස් කිරීමකින් තොරව දක්විය යුතුය පර්යේෂණය සඳහා සෘජුව උපයෝගී කොටගත්,

හා අමතරව භාවිත කළ මූලාශ්‍ර පිළිබඳ අකාරාදිව සැලසූ ලැයිස්තුවක් ලෙස ග්‍රන්ථනාමාවලිය දැක්විය හැකිය ග්‍රන්ථනාමාවලිය ඉතා දිගු වූවක් නම් එය භාවිත මූලාශ්‍රවල ස්වභාවය අනුව කොටස් කළ හැකිය. එය ග්‍රන්ථය අවසානයෙහි සටහන් කොටසට පසු ඉදිරිපත් කළ යුතුය. මූලාශ්‍රවල ස්වභාවය අනුව එය

1. ග්‍රන්ථ
2. වාර සඟරා වශයෙන් කොටස් කළ හැකිය.

ග්‍රන්ථ ලැයිස්තුව ඉතා දිගු නම් එය නැවතද කොටස් කළ හැකිය. භාවිත ග්‍රන්ථ මූලාශ්‍ර නැවතත් ප්‍රාථමික මූලාශ්‍ර (Primary Source) (අත්පිටපත්) වශයෙන්ද ද්වීතියක මූලාශ්‍ර (Secondary Source) (සාමාන්‍ය කෘති) වශයෙන්ද කොටස් කළ හැකිය. සංලේඛ (entries) සකස් කළ යුත්තේ කර්තෘවරයාගේ පෙළපත්නාමය අනුව අකාරාදි පිළිවෙළකටය.

ග්‍රන්ථනාමාවලී කරණයේදි සංලේඛ සකස් කරන ක්‍රම කිහිපයකි. ඒ අතරින් බහුලව භාවිත කරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

උදා : 1. අමරසේකර, දයා. ජනකවි හා ගැමි සමාජය.- කොළඹ : ගොඩගේ, 1996.

2. අමරසේකර, දයා. ජනකවි හා ගැමි සමාජය.-
කොළඹ : ගොඩගේ, 1996.

(දෙවන වාක්‍ය පේලිය මුල් වාක්‍යයේ තුන්වන අක්ෂරයට යටින් පටන් ගත යුතුය).

3. අමරසේකර, දයා. ජනකවි හා ගැමි සමාජය.-
කොළඹ : ගොඩගේ, 1996.

(දෙවන වාක්‍ය පේලිය මුල් වාක්‍යයේ හත්වන අක්ෂරයට යටින් පටන් ගත යුතුය) .

ග්‍රන්ථනාමාවලි කරණයේදී වැදගත් ලෙස සැලකිය යුතු කරුණු කිහිපයකි.

තනි කර්තෘවරයෙකුගේ සිට කර්තෘවරු තිදෙනෙක් දක්වා වූ ග්‍රන්ථ කර්තෘවරුන්ගේ පෙළපත් නම යටතේ සකස් කළ යුතුය.

කර්තෘවරු තිදෙනෙකුට වඩා වැඩි නම් සංලේඛය ග්‍රන්ථනාමය

යටතේ දැක්විය යුතුය.

ප්‍රාථමික මූලාශ්‍ර (අත්පිටපත්) බොහෝ විට ග්‍රන්ථනාමය යටතේ ඉදිරිපත් කළ යුතුය.

වාර සඟරා, එම සඟරා නාමය යටතේ දැක්විය යුතුය.
සූචි සංලේඛය සකස් කිරීමේදී සකස් කල යුතු පිළිවෙළ වන්නේ

ග්‍රන්ථ :- කර්තෘ/කර්තෘවරුන්, ග්‍රන්ථනාමය, සංස්කරණයක් නම් කීවෙනි සංස්කරණයද යන වග, ප්‍රකාශිත ස්ථානය, ප්‍රකාශකයා, සහ දිනය, ලබාදිය යුතුය.

සඟරා :- සඟරාවේ නම, වෙළුම, කලාපය, ලිපි ශීර්ෂය, ප්‍රකාශක ස්ථානය, ප්‍රකාශකයා සහ දිනය, පිටු පරාසය දැක්විය යුතුය.

සූචි සංලේඛය සකස් කිරීමේදී ඒ සඳහා භාවිත කළ යුතු සලකුණු කිහිපයකි. එම සලකුණු නිවැරදිව භාවිත කළ යුතුය.

එහිදි පහත දක්වෙන උදාහරණ සැලකිල්ලට ගත යුතුය.

උදා : කර්තෘගේ වාසගම, මුල්නම. ග්‍රන්ථනාමය .- ප්‍රකාශිත ස්ථානය : ප්‍රකාශකයා, දිනය .- පිටු අංක යන සලකුණු නිවැරදිව දක්වීම ඉතාමත්ම වැදගත් වේ.

ඉහත සංලේඛයෙහි විස්තර වෙන් කරන සලකුණු ඉතා නිවැරදිව යෙදිය යුතුය. (ISO - 690)

**Glossary** පාරිභාෂික ශබ්දමාලාව
පර්යේෂණ කෘතිය සඳහා පාදක කොටගත් පාරිභාෂික ශබ්දමාලාව අකාරාදිව ගොනු කොට ඉදිරිපත් කිරීම මෙමඟින් සිදු වේ. මෙයින් එම පර්යේෂණයෙහි ඇති වචන පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කෙරේ.

**Index** අනුක්‍රමණිකාව
පර්යේෂණ කෘතියෙහි ඇති ඉතා වැදගත් පුද්ගල නාම, ස්ථාන

නාම අළලා අකාරාදිව සකස්කළ වචන ලැයිස්තුවකි. එහිදී එම වචනය අන්තර්ගතයේ සඳහන් වන පිටු අංක නිවැරදිව ලබා දිය යුතුය. (ISO - 999)

## Appendices ඇමුණුම්

ප්‍රධාන අන්තර්ගතය තුළ විස්තරාත්මකව ඉදිරිපත් කළ නොහැකි සිතියම්, වගු, සැලසුම්, යනාදිය මෙම ඇමුණුම් මඟින් ඉදිරිපත් කළ යුතුය. එහිදීද ප්‍රධාන අන්තර්ගතයෙහි ඇමුණුම් අංකය දක්වා ඇමුණුම්වලද අදාළ අංකය දැක්විය යුතුය. උදා : ඇමුණුම් – 1, ඇමුණුම් 2 වශයෙනි.

## Special Details විශේෂ කරුණු

* සුදු වර්ණ කඩදාසි භාවිත කළ යුතුය.
* කළු වර්ණයෙන් යතුරුලියනය කළ යුතුය
* පත්‍රිකාවේ ප්‍රමාණය A4 (210 mm x 297 mm)
* පත්‍රිකාවේ උඩ යට සහ දකුණු පස අඟලක ඉඩ ප්‍රමාණයක් ඉතුරු වන සේ අන්තර්ගතය දැක්විය යුතුය. වම්පස අඟල් 2 ක ප්‍රමාණයක ඉඩ බැඳීම් කටයුතු සඳහා ඉතුරු කළ යුතුය.
* අන්තර්ගතයේ පේළි අතර පරතරය අක්ෂර පේළි 2 ක් (Double Space) විය යුතුය. විශාල උද්ධෘත, පාදක සටහන්, ග්‍රන්ථනාමාවලිය සහ විමර්ශන එක් අක්ෂර පේළියකින් (Single Space) වෙන් කළ යුතුය. එහෙත් ග්‍රන්ථ නාමාවලියේ සහ විමර්ශන ලැයිස්තුවේ සංලේඛ 2 ක් අතර පරතරය අක්ෂර පේළි 2 ක් විය යුතුය.
* පිටු අංකනය කිරීමේදී සෑම පිටුවකම දකුණු පස උඩ කෙළවරේ දැක්විය යුතුය. එය අනිවාර්ය නොවේ. සෑම පරිච්ඡේදයකම ආරම්භක පිටුව අංකනය නොකළ යුතුය. එහෙත් අංක ගණනයේදී එය ඇතුළත් විය යුතුය. පර්යේෂණයේ හැඳින්වීම දක්වා ඇති පිටු රෝම ඉලක්කම්වලින්ද ප්‍රධාන අන්තර්ගතයේ පිටු අරාබි ඉලක්කම්වලින්ද දැක්විය යුතුය. රෝම ඉලක්කම්වලින් අංකනය නොකරන්නේ නම් එම පිටු ගණනය කොට අන්තර්ගතයේ පළමු පිටුවේ සිට අරාබි ඉලක්කම්වලින් අංකනය ආරම්භ කළ

යුතුය ග්‍රන්ථ නාමාවලිය, සටහන්, සහ ඇමුණුම් ප්‍රධාන පිටු ගණනයට ඇතුළත් නොකෙරේ. එහෙත් එය ඇතුළත් කරනු ලබන අවස්ථාද දක්නට ලැබේ.

* පොත් නාරටියෙහි (Spine) ග්‍රන්ථනාමය, පර්යේෂකයා සහ පාඨමාලාව සඳහන් කළ යුතුය. (ISO - 6357) පොත් බැම්ම, පිට කවරයෙහි වර්ණය සහ එය සකස් කළ යුතු ක්‍රමය ඒ ඒ ආයතන නිර්දේශ කරන ලද ක්‍රමය අනුව සිදු කළ යුතුය.

වර්තමානයේ මේ විධි ක්‍රම නිවැරදිව හඳුනා නොගැනීමත් විවිධ විධික්‍රම මිශ්‍ර කරමින් නිබන්ධන සකස් කිරීමක් දක්නට ලැබේ.

ISO - උපාධි නිබන්ධන සකස් කිරීමේ විධි ක්‍රමයට අමතරව ජාත්‍යන්තරව පිළිගත් විධි ක්‍රම කීපයක් දක්නට ලැබේ. ඒ අතර APA - American Psychological Association - ක්‍රමයද, MLA - Modern Language Association of America සහ Harvard ක්‍රමයද දැක්විය හැක. මේ කුමන ක්‍රමයක් භාවිතා කලද මුලු පර්යේෂණයම එක් විධි ක්‍රමයකට අනුව පමණක් සකස් කිරීම කළ යුතුය.

## References විමර්ශන


| | |
|---|---|
| ISO - 7144 | Documentation - presentation of theses and similar documents |
| ISO - 214 | Documentation - abstracts for publications and documentation |
| ISO - 690 | Documentation - bibliographical references essential and supplementary elements |
| ISO - 999 | Documentation - index of a publication |
| ISO - 1086 | Documentation - title leaves of a book |
| ISO - 2145 | Documentation - numbering of divisions and sub divisions in written documents |
| ISO - 2384 | Documentation - presentation of translation |
| ISO -2108 | ISBN |
| ISO - 6357 | Documentation - spine titles on books and other publications |
| ISO - 832 | Bibliographical references - abbreviation of typical words |